# ඩයලොග් පාරිභෝගික සේවා මධ්‍යස්ථාන රටපුරා විහිදේ

**IOC පිරවුම්හල් හා ලාෆ්ස් සුපිරි වෙළෙඳසල් ආශ්‍රිතව ඩයලොග් පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ජාලය පුළුල් කෙරේ**

පාරිභෝගික පහසුකම් වර්ධනය කිරීමේ අදහසින් ඩයලොග් සමාගම තම පාරිභෝගිකයන්ට මනා සේවයක් ලබාදීම පිණිස වඩා පුළුල් පාරිභෝගික මධ්‍යස්ථාන ගණනක් තෝරා ගත් IOC පිරවුම්හල් හා ලාෆ්ස් සුපිරි වෙළෙඳසැල්වල පිහිටුවා ඇත.

මෙහි ප්‍රධාන අරමුණ වනුයේ ඩයලොග් පාරිභෝගිකයන්ට ගමන් බිමන්වල යෙදෙන අතරතුර ඉතා පහසුවෙන් සේවා ලබාදීමය. එහිදී ඉන්ධන පිරවුම්හල් හා සුපිරි වෙළඳසැල් පාරිභෝගිකයන් රැස්වන ප්‍රධාන ස්ථානයන් 2ක් ලෙස ඩයලොග් විසින් හඳුනාගෙන ඇත.

ගමන් බිමන්වල යෙදෙන අතරතුර පාරිභෝගිකයන්ට සේවා සැපයීම සඳහා මෙය සුදුසුම මාර්ගය වන බව සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී දුමින්ද රත්නායක මහතා පවසයි. "අප සැමවිටම උත්සාහ දරන්නේ පාරිභෝගිකයාට වඩා පුළුල් හා උසස් මට්ටමේ සේවයක් ලබාදීමටයි. කාලය, පාරිභෝගිකයන්ට ඉතා වැදගත් වන අතර, වාහන තදබදය සමගම එක් ස්ථානයකින් තවත් ස්ථානයකට ගමන් කිරීමට දැඩි වෙහෙසක් දැරීමටත් වැඩි කාලයක් ගත කිරීමටත් සිදුවේ. මේ හේතුවෙන් අප පාරිභෝගිකයන් සමග ඉතා සමීපව කටයුතු කිරීමට මෙවැන්නක් තුළින් උත්සාහ දරනවා" යනුවෙන්ද රත්නායක මහතා පවසයි.




අලුතින්ම හඳුන්වා දුන් Shop in Shop සංකල්පය අන්තර්ජාලය හරහා ද සේවා සපයනු ඇත. බිල් ගෙවීම්, පෙර ගෙවුම් හා පසුගෙවුම් සිම්පත් අලෙවිය, Scratch Card සහ රීලෝඩ්, Handsets හා විශේෂ අමතර සේවා මීට අයත්ය. ඉහත සඳහන් සේවාවන්ට අමතරව ඉන් එක් සේවා මධ්‍යස්ථානයක පහත සඳහන් ගනුදෙනු කිරීමේ හැකියාව ද පවතී.